# මොඩියුල අංක 10

# ගුරු වෘත්තීය සංවර්ධනය

Teacher Education Administration Branch

e-Learning by TEA
Teacher Education Administration Branch

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

# ගුරු වෘත්තීය සංවර්ධනය

**හැඳින්වීම :**

ගුරු යන්න අලෝකය පතුරුවන්නා යන අරුත් දෙයි. එ නම හිමි ගුරුවරයා, සිසු දරුවන්ට ඥානාලෝකය සපයමින් ඔවුන් අනාගතය උදෙසා සූදානම් කරවීමක් සිදු කරයි. හෙට දවස වෙනුවෙන් අද පාසලෙහි ගෙවනු ලබන සිසුනගේ කාලය වඩාත් අර්ථාන්විත වනුයේ, ගුරු කාර්ය සඵලදායී වුවහොත් පමණි.

ශිෂ්‍යයාගේ ශාස්ත්‍රීය කුසලතා, සමාජ කුසලතා සහ චින්තන කුසලතා ඔප්නැංවීම වෙනුවෙන් ගුරුවරයාට අනේක විධ ක්‍රමෝපායයන් සොයා යන්නට සිදු වෙන අතර ඒ සඳහා ගුරුවරයාට නිතැතින් ම ගුරු වෘත්තීය සංවර්ධන අවස්ථා කෙරෙහි යොමු වන්නට සිදු වෙයි. එය, තමන්ගේ වෘත්තීය අභිමානයට මෙන් ම තමන් විසින් ඉටු කරනු ලබන සත් කාර්යයේ සාර්ථකත්වයට ද හේතු වෙයි. ගුරුවරයාට 21 වන සියවසට ගැලපෙන සුහුරු පුරවැසියා තම පන්ති කාමරයෙන් බිහිකිරීමේ අභියෝගය ජය ගැනීම සඳහා ගුරු වෘත්තීය සංවර්ධන අවස්ථා, මහඟු පිටුබලයක් සපයනු ඇත. ගුරු වෘත්තීය සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ විස්තර කෙරෙන මෙම මොඩියුලයෙන් පහත දැක්වෙන අරමුණු ඉටු කර ගැනීම අපේක්ෂා කෙරෙයි. මෙම මොඩියුලය හැදෑරීමෙන් ගුරු වෘත්තීය සංවර්ධනය පිළිබඳ ව සමස්ත දැක්මක් ඔබට ලබා ගැනීමට හැකි වනු ඇත.




e-Learning by TEA
Teacher Education Administration Branch

**ඉගෙනුම් ඵල**

1. ගුරුවරයා විසින් ඵලදායි ගුරු නිපුණතාවන් ප්‍රදර්ශනය කරනු ලබයි.
2. ගුරුවරයා ස්වයං අභිමානයෙන් යුතු ව කාර්යයයේ නිරත වෙයි.
3. ඉගෙනුම්ලාභීන්, ඉගෙනුම කේන්ද්‍ර කර ගත් සුතථ්‍ය ඉගෙනුමෙහි (සජීවී ඉගෙනුම - *Authentic learning*) යෙදෙයි.
4. ගුරුවරයා සහ ශිෂ්‍යයා, නිර්මාපී චින්තනයෙන් යුතු ව කාර්යයෙහි නිරත වෙයි.
5. වැඩ ලෝකයට දායක වන යහ පුරවැසියන් ලෙස සිසුන් සමාජගත වෙයි.

මෙම ඉගෙනුම් ඵලවලට ළඟා වීම සඳහා ගුරුවරයා කවර ලෙසකින් සන්නද්ධ විය යුතු දැ යි සිතීම වටියි. ඒ සඳහා භාවිත කළ යුතු ගුරු සංවර්ධන ක්‍රමවේද හඳුනා ගැනීම මෙහිදී වැදගත් වෙයි.

➢ ***මෙම මොඩියුලය අධ්‍යයනයට ඔබේ පෙර සූදානම තක්සේරු කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.***

පහත දැක්වෙන ප්‍රකාශ සම්බන්ධයෙන් ඔබේ එකඟතාවය අදාළ කොටුවෙහි √ ලකුණින් සඳහන් කරන්න.

1. ගුරුවරයා සතු විෂයානුබද්ධ දැනුම ඉගැන්වීම් කාර්යය සඳහා ප්‍රමාණවත් වෙයි. ☐
2. පාසල තුළ ලබන අත්දැකීම්, වෘත්තීය සංවර්ධනය උදෙසා දායක කර ගත හැකිය. ☐
3. ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඇති වන ගැටලු නිරාකරණය සඳහා මිතුරු ගුරුවරුන්ගේ සහය ලබා ගැනීම බුද්ධිමත් ක්‍රියාවක් නො වේ. ☐
4. ඉගැන්වීම් ක්‍රියාවලිය නිතර ආවර්ජනය කිරීම (ප්‍රත්‍යවේක්ෂණය), වෘත්තීය සංවර්ධනයට හේතු වෙයි. ☐
5. තමන්ගේ පන්ති කාමර කටයුතු බාහිර කෙනෙකුන් විසින් දැනගැනීම සුදුසු නැත. ☐

**මොඩියුලයේ පෙළගැස්ම**

1. වෘත්තීය ගුරු සංවර්ධනය හැඳින්වීම
2. වෘත්තීය ගුරු සංවර්ධනයේ ස්වභාවය
3. පාසල් පාදක ගුරු සංවර්ධනය
    - 3.1. පාසල් පාදක ගුරු සංවර්ධනය යනු කුමක්ද
    - 3.2. පාසල් පාදක ගුරු සංවර්ධන අවශ්‍යතා හඳුනාගැනීම
    - 3.3. පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන්වල ස්වභාවය
    - 3.4. පාසල් පාදක ගුරු සංවර්ධන ක්‍රමවේද

## 1. වෘත්තීය ගුරු සංවර්ධනය හැඳින්වීම

ශ්‍රී ලංකාවෙහි පාසල්වලට ගුරුවරුන් බඳවා ගැනීම පහත සුදුසුකම් මත සිදු වෙයි.

1. අධ්‍යාපනවේදී උපාධිධාරීන්
2. උපාධිධාරීන්
3. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලින් න්‍යායයාත්මක හා ප්‍රායෝගික දැනුම ඇතුළත් තෙවාර්ෂික පාඨමාලාවකින් සුදානම් කරන ලද ශික්ෂණවිද්‍යා ඩිප්ලෝමාධාරීන්
4. ඩිප්ලෝමාධාරීන්
5. අ. පො. ස. (උසස් පෙළ) සුදුසුකම් ලැබූවන්

(වැඩි දුර අධ්‍යයනය සඳහා 2014 ඔක්තොම්බර් 23 අංක 1885/38 දරන ගැසට් නිවේදනය: ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය)

ඉහත දැක්වූ කණ්ඩායම් අතරින් අධ්‍යාපනවේදී උපාධිධරයන් හා ශික්ෂණවිද්‍යා ඩිප්ලෝමාධාරීන්, ගුරු වෘත්තීය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමක් ලත් අය වෙති. උපාධිධරයන් විෂය දැනුමින් සන්නද්ධ වූව ද, ඉගැන්වීම පිළිබඳ න්‍යායාත්මක හෝ ප්‍රායෝගික අත්දැකීම් ලබා නැත.

ගුරු වෘත්තියට ප්‍රවිෂ්ට වන්නන් කවරකු හෝ වේවා, ඔවුන් හට විෂය දැනුමට එහා ගිය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී අත්‍යාවශ්‍ය වූ අධ්‍යාපන මනෝවිද්‍යාව, ළමා මනෝවිද්‍යාව, අධ්‍යාපන උපදේශනය, අධ්‍යාපන ව්‍යවහාර, විවිධ අධ්‍යාපන සංකල්ප, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද ආදී වූ අධ්‍යාපන විද්‍යාව හා බද්ධ වූ දැනුම තිබිය යුතු ම වන්නේ ය.

මෙම කවර වූ හෝ ආකාරයේ දැනුම් හා අත්දැකීම් රැසක් අත්පත් කරගැනීමෙහි ලා වෘත්තීය ගුරු සංවර්ධන අවස්ථා විසින් ලබා දෙන අත්වැල සුළුපටු නො වේ. සේවයේ යෙදීමට ප්‍රථම හෝ සේවයේ යෙදී සිටිය දී හෝ වෘත්තියාභිමුඛ ව වෘත්තිය සංවර්ධනයෙහි ලා ලබා ගන්නා න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම අතිශයින් ම වැදගත් වනුයේ එබැවිනි.

වෙනස් වන ලෝකය හමුවේ සාම්ප්‍රදායික විෂය නිර්දේශ හා යල්පැන ගිය ක්‍රමවේද ඇසුරින් ශිෂ්‍යයින් ඥානනය කිරීමට උත්සහ කිරීම හාසෝත්පාදක වෙයි. වර්තමාන දරුවා, ඇල්ෆා පරම්පරාව නියෝජනය කරනු ලබයි. ගුරුවරයා තම කාර්යය වඩාත් සුඛනම්‍ය කරගැනීමට නම්, තමන්ගේ පාත්‍ර වර්ගයා වන ශිෂ්‍ය ජනගහනය නිවැරදි ව හඳුනා ගත යුතුය. තමා විසින් සිසුනට දෙන දැනුම වඩාත් සුදුසු හා ප්‍රබල ව ඔවුනට අත්පත් කර දීමට නම්, අවශ්‍යතාවය මත ම ප්‍රබල වූ නිර්මාණාත්මක ශිල්ප ක්‍රම භාවිත කළ යුතු වේ. මේ සියල්ල සඳහා වෘත්තිය ගුරු සංවර්ධනය අත්‍යවශ්‍ය වෙයි.

## 2. වෘත්තීය ගුරු සංවර්ධනයේ ස්වභාවය

පන්තිකාමරය තුළ ගුරුවරයා සවිබල ගැන්වීම උදෙසා දේශීය සහ ජාත්‍යාන්තර වශයෙන් විවිධ ක්‍රමවේද හා ශිල්පීය ක්‍රම අත්හදා බැලීම් විරල නොවේ.

ප්‍රධාන වශයෙන් ගුරු සංවර්ධන ක්‍රමවේද දෙ ආකාරය :

- දිගුකාලීන
- කෙටිකාලීන

- **දිගුකාලීන ක්‍රමවේද**

මාස 6ක් හෝ ඊට වැඩි කාලයක් වැය කරමින් හදාරනු ලබන පාඨමාලාවන් දිගුකාලීන ක්‍රමවේදය යටතට ගැනේ. මෙම පාඨමාලාවන් පූර්ණකාලීන හා අර්ධකාලීන වශයෙන් දෙ ආකාර වෙයි. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව මීට උදාහරණ වෙයි. මෙ තුළින් වෘත්තීයභාවය මුවහත් කිරීමට හේතු වන න්‍යායාත්මක දැනුමක් ගුරුවරයා වෙත ලබා දෙන අතර ඉගැන්වීම වඩාත් සාර්ථක වීම සඳහා යෝග්‍ය වන ආකෘතීන් ද සපයා දෙනු ලැබෙයි. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව ගුරුවරයාගේ වෘත්තීය කඩඉම් සඳහා පාදක වීම, එහි විශේෂත්වය යි.

මේ හැර, ගුරුවරයා පර්යේෂණාත්මක ප්‍රවේශයකට යොමු කරවන අධ්‍යාපනපති, අධ්‍යාපන දර්ශනපති හා අධ්‍යාපන දර්ශනශූරී ආදී පශ්චාත් උපාධි, ගුරුවරයාගේ වෘත්තීය පරිචය වඩාත් මුවහත් කිරීමට දායක වෙයි.

කොළඹ විශ්වවිද්‍යාලය, පේරාදෙනිය විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය, විවෘත විශ්වවිද්‍යාලය හා ජාතික අධ්‍යාපන ආයතනය එවැනි පාඨමාලා පවත්වනු ලබන අධ්‍යාපන ආයතන සඳහා නිදසුන් වෙයි.

http://www.cmb.ac.lk/academic/edu/courses.htm

http://arts.pdn.ac.lk/education/PGDE.html

http://www.arts.jfn.ac.lk/index.php/education/

https://www.ou.ac.lk/faculty-of-education/

https://www.nie.edu.sg/teacher-education/postgraduate-diploma-in-education-programmes-pgde

e-Learning by TEA
Teacher Education Administration Branch

- **කෙටිකාලීන ක්‍රමවේද**

මාස 6කට අඩු කාල වකවානුවක දී හදාරනු ලබන පාඨමාලාවන් කෙටිකාලීන ක්‍රමවේදයට ඇතුළත් වෙයි. එසේම, ගුරු සේවයට අවතීර්ණ වූ දින සිට ම ලැබෙන සියලු ම වෘත්තීය අත්දැකීම් කෙටිකාලීන ක්‍රමවේද යටතට ඇතුළත් කළ හැකිය. පත්වීම ලත් හා ම ලැබෙන දිශාභිමුඛ වැඩසටහන් මෙහිදී පුමුඛ කොට දක්වාලිය හැකිය. ඉන් අනතුරු ව සහභාගි වීමට ලැබෙන සේවාස්ථ සැසි හා ගුරු කාර්යක්ෂමතාවන් සඳහා හැදෑරීමට සිදු වන මොඩියුල පාඨමාලාවන් ද කෙටිකාලීන ක්‍රමවේද සපයා දෙයි.

මේ හැර, කෙටිකාලීන පාඨමාලාවන් යටතට දෙස් විදෙස් අධ්‍යයන චාරිකා , ක්ෂේත්‍ර චාරිකා ද ඇතුළත් වෙයි.

පුළුල් වෘත්තීය අවබෝධයක් ලබා දෙන කාර්ය මූල පර්යේෂණයන් ද මෙහි දී විශේෂය ය.

දිගුකාලීන හා කෙටිකාලීන සැසි සහ පාඨමාලාවන් සඳහා යොමුවීමෙන් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනයක් සිදු වුව ද, ඒ සඳහා ඔවුන් පාසලෙන් බැහැර යාම නිසා ඇති වන සෘණාත්මක ප්‍රතිඵල, පාසල් පද්ධතියට බලපෑමක් කරනු ලබන බව ඒ පිළිබඳ ව කරන ලද පර්යේෂණ මගින් අනාවරණය වී තිබේ.

එබඳු පර්යේෂණ අනාවරණ කිහිපයක් මතු දැක්වේ :

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාධා ඇති වීම.
- පාසලලෙහි පරිපාලන කටයුතුවලට සෘජු බලපෑමක් ඇති වීම.
- පාසලෙහි විනය ආශ්‍රිත ගැටලු නිර්මාණය වීම.
- ශිෂ්‍ය කාර්ය සාධනය පහත වැටීම.

මෙම ගැටලුවට ලබා දිය හැකි යෝග්‍යතම විසඳුමක් සෙවීමේ දී ගුරු අධ්‍යාපනයේ නව ප්‍රවණතාවයක් ලෙසින් ලෙස පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් කෙරෙහි ලෝකයේ ම අවධානය යොමු වී ඇත.

**ගුරු වෘත්තීය සංවර්ධන අවස්ථා පහත පරිදී දැක්විය හැකිය :**

ගුරු වෘත්තීය සංවර්ධනය

- පූර්ව සේවා
  - දිගු කාලීන
    - අධ්‍යාපනවේදී ( විශ්ව විද්‍යාල මගින් - කොළඹ, පේරාදෙනිය, යාපනය
  - කෙටි කාලීන
    - උපාධිධාරී ගුරු දිශාභිමුඛ වැඩසටහන්
- සේවාස්ථ (සේවයේ යෙදී සිටිය දී )
  - දිගු කාලීන
    - අධ්‍යාපනවේදී (ජා.අ.ආ., විවෘත වි.වි.)
    - ගුරු පුහුණුව (ගුරු විදුහල්)
    - පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශ්ව විද්‍යාල, ජා.අ.ආ.)
    - අධ්‍යාපනපති (විශ්ව විද්‍යාල, ජා.අ.ආ.)
    - අධ්‍යාපන දර්ශනපති (විශ්ව විද්‍යාල, ජා.අ.ආ.)
    - අධ්‍යාපන දර්ශනශූරී (විශ්ව විද්‍යාල)
  - කෙටි කාලීන
    - උපාධිධාරී ගුරු පුහුණුව
    - පළාත් වැඩසටහන්
    - කලාප වැඩසටහන්
    - කොට්ඨාස වැඩසටහන්
    - ගුරු කාර්යක්ෂමතා මොඩියුල
    - විදේශ අධ්‍යයන චාරිකා
    - ක්ෂේත්‍ර චාරිකා
  - සේවා කාලය තුළ දී
    - පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන්

## ගුරු සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම

නූතන ගෝලීය අභියෝග හමුවේ, පන්ති කාමරයේ දී මුණගැසෙන දරුවා හුදෙක් සාම්ප්‍රදායික චින්තනය හෝ මතවාද මත යැපෙන්නෙකු නො වේ. අනෙක් අතට අනේක විධ අත්දැකීම් අතැති ව පාසලට එන ශිෂ්‍යයා, ගුරුවරයා හෝ විෂය නිර්දේශ ඉක්ම වන කුතුහලයකින් හා ප්‍රායෝගික දැනුමකින් යුතු වේ. මේ තත්ත්වය තුළ ගුරුවරයාට පන්ති කාමරයේ දී ගනු දෙනු කිරීමට සිදු වන්නේ අභියෝගයන් රැසක් මැද ය. විෂය කරුණින් පමණක් සන්නද්ධ ව පන්ති කාමරයට යාම ම, ඇතැම් විට ගුරුවරයා අසරණබවට පත් කිරීමට හේතු විය හැකිය. මේ නිසා ම, ඔහුට විවිධාකාර වූ පුළුල් දැනුමක් සහ ශිෂ්‍යයා වෙත එය සම්ප්‍රේෂණය කිරීමේ දී භාවිත කළ යුතු නූතන ක්‍රම ශිල්ප හා මෙවලම් ද ආශ්‍රය කරගැනීමට සිදු වෙයි. මේ අභියෝගය, ගුරුවරයාට තමා තුළ වෘත්තීමය සංවර්ධනයක් තවදුරටත් ගොඩනගා ගත යුතු බවට අවශ්‍යතාවයක් උදා කරනු ඇත.

**ගුරුවරයාට සිය භූමිකාව තුළ දී මුහුණ දීමට සිදු වන අභියෝග :**

1. පන්ති කාමරයේ දී ඇති වන ගැටලු
   - පන්ති කාමර කළමනාකරණය
   - සිසු විනය
2. විෂයානුබද්ධ ව ගොඩනැගෙන ගැටලු
3. ඉගැන්වීමේ ක්‍රමවේද පිළිබඳ ගැටලු
4. සිසු සාධනය ඉහළ නො යාම පිළිබඳ ගැටලු
5. පාසලේ අනෙකුත් කළමනාකරණ කටයුතුවලට සහභාගී වීමේ දී ඇති වන ගැටලු

ඉහත ආකාරයට ගුරුවරයාට මුහුණ දීමට සිදු වන විවිධ ගැටලු සඳහා විසඳුම් ලබා ගැනීම උදෙසා අංශ ප්‍රධාන, විෂය ප්‍රධාන ගුරුවරුන් මෙන් ම විදුහල්පති විසින් ද අවස්ථා සම්පාදනය කර දීම අත්‍යාවශ්‍ය ය.

එ ලෙස උත්පාදනය කරනු ලබන අවස්ථා, වෘත්තීය ගුරු සංවර්ධන අවශ්‍යතා සඳහා යොදා ගත හැකිය.

**ඉගැන්වීම් කාර්යයේ දී අපට මුහුණ දීමට සිදු වන ගැටලු හා අභියෝගයන්ට විසඳුම් ලබා ගන්නේ කෙසේද ? ( වෘත්තීය ගුරු සංවර්ධනය සඳහා යොදා ගත හැකි අවස්ථා )**

1. සමාන්තර පන්තිවල එකම විෂය උගන්වන ගුරු භවතුන් එකට එකතු වී ගැටලු සාකච්ඡා කිරීම හා සාමූහික යෝජනා මඟපෙන්වීම් බෙදා හදා ගැනීම.
2. ජ්‍යෙෂ්ඨ ගුරුවරුන්ගේන් ලබන මඟපෙන්වීම්.
3. විදුහල්පති සමඟ කරන සාකච්ඡා.
4. ගුරු රැස්වීම්.
5. ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානවලින් ලබන සහය.
6. ගුරු උපදේශකවරුන්ගෙන් ලබන සහය.
7. පාසලේ ම විශේෂ ප්‍රාගුණ්‍යය සහිත ගුරුවරුන් ලවා දැනුම බෙදා දීම.
8. පාසලෙන් පරිබාහිර, ඒ ඒ විෂය විශේෂඥයින් ලවා මඟපෙන්වීම් ලබා දීම.

ගුරුවරුන් අතර සිදු වන නිරන්තර සාකච්ඡා, ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යය වඩාත් සඵල කර ගැනීමට තුඩු දෙන මාතෘකා වන්නේ නම්, ඔවුන් කාර්යබද්ධ ව ක්‍රියා කරනු ලබන, යහ ගුරු ආකල්ප ඇත්තවුන් ලෙස ගිණිය හැකිය.

## 3. පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධනය

### 3.1. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධනය හැඳින්වීම

ගුරුවරයා යාව ජීව ව වෘත්තීය සංවර්ධනයෙහි නියැලිය යුත්තේ ය. ඒ සඳහා පාසල තුළ මෙන්ම ඉන් පරිබාහිර ව ද අවස්ථා උත්පාදනය කර ගත හැකිය. පාසල කේන්ද්‍ර කර ගත් වෘත්තීය සංවර්ධන අවස්ථා, පාසල් පාදක ගුරු සංවර්ධනය වෙයි.

එහිදී,

- පාසල් සංස්කෘතිය
- පාසලට සුවිශේෂී ශිෂ්‍ය සමාජ තත්ත්වය
- පාසලෙහි ශිෂ්‍ය සාධන මට්ටම්
- පාසල තුළ උද්ගත වන වෘත්තීය ගැටලු
    - ශාස්ත්‍රීය - අධ්‍යාපන
      පරිපාලන
    - සමාජයීය

වශයෙන් වෘත්තීය සංවර්ධන අවස්ථා උදා කර ගැනීම වඩා ප්‍රතිඵලදායී වේ.

**පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන්,**

- ගුරුවරුන් විසින් කෙරෙන යෝජනා හා ඉල්ලීම්වලට වැඩි අවස්ථා දෙයි.
- ගුරුවරුන් විසින් සැලසුම් කෙරෙයි.
- පාසල තුළ ම ක්‍රියාත්මක කෙරෙයි.
- ස්වයං ඇගයීම් සිදු වෙයි.
- අඛණ්ඩ ව සිදු වෙයි.
- සාමූහික යෝජනා හා විසඳුම් කෙරෙහි යොමු වෙයි.
- සක්‍රීය සහභාගිත්වයෙන් යුතු වෙයි.
- වෘත්තීය සාර්ථකත්වය කෙරෙහි ස්වයං අභිප්‍රේරණයක් ඇති කරයි.

## 3.2. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම

පාසලක විදුහපල්පති ප්‍රමුඛ ගුරු මණ්ඩලය යනු ගොනුවකි. එහි සාමාජික පුද්ගලයන් විවිධ ය. එනම්, එක් එක් පුද්ගලයා අනෙකාගෙන් වෙනස් වේ. රුචීන්, දක්ෂතා, හැකියාවන් මෙන් ම ආකල්ප ද එකිනෙකාගෙන් වෙනස් වේ. ඒ අනුව, ගුරු වෘත්තීය අවශ්‍යතා ද විවිධ වේ. එ බැවින් පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන් ද තේමා ගත විය යුත්තේ, මෙම විවිධත්වය පදනම් කර ගනිමිනි.

**ගුරුවරුන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමට විවිධ ක්‍රම භාවිත කළ හැකිය :**

- අභ්‍යන්තර අධීක්ෂණ
- බාහිර අධීක්ෂණ
- ගුරුවරුන්ගේ ඉල්ලීම්
- කාර්ය සාධන ඇගයීම්
- නිරීක්ෂණ
- සිසු අදහස් / දෙමාපිය අදහස්
- සාමූහික සාකච්ඡා - ගුරු රැස්වීම්
- ගැටලු පෙට්ටිය
- ප්‍රත්‍යාවේක්ෂණ ජර්නල
- ...
- ...

### 3.3 පාසල් පාදක ගුරු සංවර්ධන ක්‍රමවේද

වෙනත් ගුරු සංවර්ධවන ප්‍රවේශවල දී භාවිත කරනු ලබන ක්‍රමවේදයනට වඩා සුවිශේෂී ක්‍රමවේද, පාසල් පාදක ගුරු සංවර්ධනයේ දී භාවිත කළ හැකිය. නිදසුන් කිහිපයක් පහත දැක්වේ :

- සමපදස්ථ සාකච්ඡා
- සමපදස්ථ නිරීක්ෂණ
- සමාන්තර පන්ති හා විෂය ගුරු ක්‍රියාකාරකම්
- තත්ත්ව කව
- ශාස්ත්‍රීය අන්තර්ගතයන් සහිත ගුරු රැස්වීම්
- ප්‍රදර්ශන පාඩම් ආශ්‍රිත ක්‍රියාකාරකම්
- ක්ෂේත්‍ර චාරිකා
- පාසලේ ම විශේෂඥ දැනුමැති ගුරුවරුන් ලවා කෙරෙන දැනුවත් කිරීම් / වැඩසටහන්
- බාහිර සම්පත්දායක දේශන / වැඩමුළු
- සායනික අධීක්ෂණ
- කාර්ය මූලික පර්යේෂණ
- ...
- ...

e-Learning by TEA
Teacher Education Administration Branch

**ඇගයීම**

මෙම මොඩියුලයෙන් ඔබ ලබා ගත් දැනුම පරීක්ෂා කිරීම සඳහා පහත දැක්වෙන දිගුව (link) මත click කර එහි ඇති ප්‍රශ්නාවලියට පිළිතුරු සපයන්න.

Link: https://forms.gle/HEaVB4DXUMUx5r538